# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 2151/41 - 2019 නොවැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.11.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

2020 වර්ෂය සඳහා නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ උපදෙස් මාලාව

යහපත් හා ගුණාත්මක ජන මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම වෙනුවෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට නිල ජනමාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනුයේ ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මක බව වර්ධනය කරමින් ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමත්, රාජකාරි කටයුතු බාධාවකින් තොරව ඉටුකිරීමත් සඳහාය.

ප්‍රවෘත්ති හා තොරතුරු රැස්කරන, එම තොරතුරු සංස්කරණය කරන, සපයාගත් තොරතුරු විද්‍යුත්, මුද්‍රිත හෝ වෙබ් මාධ්‍ය මගින් ග්‍රාහකයා/පාඨකයා වෙත සන්නිවේදනය කරනු ලබන තැනැත්තා ප්‍රවෘත්ති කලාවේදියකු/ජනමාධ්‍යවේදියකු වශයෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේදී සලකනු ලැබේ. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ එම කර්තව්‍යයේ යෙදෙන වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට පමණි.

මෙම හැඳුනුම්පත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට පමණක් ලබාදීම සඳහා නිර්දේශ කිරීමට පියවර ගන්නා ලෙස සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන්ගෙන් සහ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු අංශ ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මාධ්‍ය හැඳුනුම්පත ලබාගැනීම සඳහා මාධ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන නාමලේඛණය පිළිබඳ පූර්ණවගකීම එය සහතික කරන මාධ්‍ය ආයතන ප්‍රධානියා/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක හෝ අදාළ බලධාරියා සතුය.

මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ලිපිලේඛන හා නිර්ණායක කෙරෙහි අදාළ පාර්ශ්වයන්ගේ අවධානය යොමු කරවමි.

**මුද්‍රිත මාධ්‍ය**

1. ආයතනගත /මාණ්ඩලික මාධ්‍යවේදීන් (Journalist) - අංක 01 හා 02

2. ඡායාරූප මාධ්‍යවේදීන්(Photo Journalist) - අංක 01 හා 02

3. ප්‍රාදේශීය මාධ්‍යවේදීන්Journalist-PJ - අංක 03


1A - G 31588 – 27 (2019/11)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. නිදහස් මාධ්‍යවේදීන් Journalist (F/L) - අංක 04

5. මාධ්‍ය පරිපාලක (Media Administrator) - අංක 07

**විද්‍යුත් මාධ්‍ය**

**(ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය)**

1. රූපවාහිනී මාධ්‍යවේදී (TV Journalist) - අංක 01 හා 02

2. ගුවන්විදුලි මාධ්‍යවේදී (Radio Journalist) - අංක 01 හා 02

3. රූපවාහිනී කැමරා මාධ්‍යවේදී (TV Camera Journalist) - අංක 01 හා 02

4. සම්ප්‍රේක්ෂකයන් (නිවේදක) (Presenter) - අංක 01 හා 06

5. මාධ්‍ය පරිපාලක (Media Administrator) - අංක 01 හා 07

6. තාක්ෂණික ශිල්පීන් (Technical) - අංක 01 හා 08

7. මාධ්‍ය සේවා (Media service) - අංක 01 හා 09

**වෙබ් මාධ්‍යවේදී** Web Journalist - අංක 10

**රාජ්‍ය මාධ්‍ය නිලධාරීන්**

1. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති නිලධාරී /මාධ්‍ය ලේකම් Media official - අංක 05
2. මාධ්‍ය සේවා - අංක 09

**විදේශ මාධ්‍යවේදීන්** Foriegn Media

1. විදේශීය මාධ්‍ය ආයතන වෙනුවෙන් කටයුතු කරන දේශීය නියෝජිතයන්හා තාවකාලිකව මෙරටට පැමිණෙන මාධ්‍යවේදීන් - අංක 11

- **මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපිලේඛන**

01. i. පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනම මත ජනමාධ්‍යවේදියකු වශයෙන් අවම වශයෙන් මාස 06 කට වැඩිකාලයක් සේවයේ නියුතු විය යුතුය. (පුහුණුවීම් පදනමින් සේවය කරන්නන්ට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.)

ii. අදාළ මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය පහත දැක්වෙන ආකෘතියට අනුව සකස්කර මාධ්‍ය හැඳුනුම්පත ලබාදෙන ලෙස ඉල්ලීම් කරනු ලබන ලිපිය හා නාමලේඛනය ආයතනයේ ලිපිශීර්ෂය යටතේ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී/ ප්‍රධානකර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය නම, තනතුර, අත්සන සමඟ නිල මුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

| අනුඅංකය | නම | ජා.හැ.අංකය | තනතුර | සේවය කරන අංශය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |

iii. නාමලේඛනයේ සෑම පිටුවකම මාධ්‍ය හැඳුනුම්පත් ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම් සහිත ලිපිය සහතික කරනු ලබන තැනැත්තා විසින් අත්සන හා නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.

iv. නාමලේඛනයේ සඳහන් තනතුර තහවුරු කිරීම සඳහා මාධ්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යාලයීය හැඳුනුම්පතෙහි ඡායාපිටපතක් නාමලේඛනය සහතික කරන තැනැත්තා විසින් අත්සන හා නිලමුද්‍රාව තබා සත්‍ය පිටපතක් බවට සහතික කළ යුතුය.

v. කාර්යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවකදී තම පත්වීම් ලිපියෙහි පිටපතක් නාමලේඛනය සහතික කරනු ලබන තැනැත්තා විසින් නම, තනතුර, අත්සන සමඟ නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.

vi. රජයේ ප්‍රවෘත්ති දෙපාර්මේන්තුවේ නිල වෙබ් අඩවිය(www.dgi.gov.lk) හෝරජයේ නිල පුවත් වෙබ් අඩවිය (www.news.lk) හෝවෙතින් 2020 වර්ෂය සඳහා අදාළ අයදුම්පත් බාගතයුතුය.

vii. සමස්ත නාම ලේඛනයට අමතරව, වෙන් වෙන් වශයෙන් සෑම අයදුම්පතක්ම අදාළ මාධ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි/ ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ /ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති කළමනාකරු/ ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය අත්සන හා නිලමුද්‍රාව තබා සහතික කිරීම අනිවාර්යය වේ.

viii.මාස 06ක කාලයක් තුළ ලබාගත් අඟල් 1X1.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා එවිය යුතුය.

ix. 2020 වසර තුළ නිකුත් කරනු ලබන මාධ්‍ය හැඳුනුම්පත්වල වලංගු කාලය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ.

**02. ආයතනගත / මාණ්ඩලික මාධ්‍යවේදීන්**

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ ආයතන ගතව සේවය කරන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා ඉහත අංක 01 හි i සිට ix දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය. පුවත්පත්, ගුවන්විදුලි, රූපවාහිනි, වෙබ් මාධ්‍යවේදීන් හා ඡායාරූප/වීඩියෝ කැමරා මාධ්‍යවේදීන් මෙම කාණ්ඩයට අයත් වේ.

**03. ප්‍රාදේශීය මාධ්‍යවේදීන්**

I. 2020/2021 යන දෙවසර සඳහා, එනම් 2021 දෙසැම්බර් 31 දක්වා වලංගු වන පරිදි ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

II. ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය අදාළ මාධ්‍ය ආයතනය විසින් දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන්ව පහත සඳහන් තොරතුරු සහිතව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වෙත ඉදිරිපත්කළ යුතුය.

(අ) මාධ්‍යවේදියාගේනම
(ආ) ජාතික හැඳුනුම්පත් අංකය
(ඇ) ස්ථිර ලිපිනය
(ඈ) වාර්තාකරු ආවරණය කරනු ලබන දිස්ත්‍රික්කය හා ප්‍රදේශය
(ඉ) මාධ්‍යවේදියාගේ දුරකථන අංකය

iii. තම ආයතනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය, මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/ අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරි/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රධාන ප්‍රවෘත්ති සංස්කාරක/ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක විසින් නම, තනතුර අත්සන හා නිලමුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ සෑම පිටුවකම නාමලේඛණය සහතික කරනු ලබන තැනැත්තා විසින් තම අත්සන හා නිලමුද්‍රාව තබා සහතික කළ යුතුය.

iv. එම නාමලේඛනයේ මුල්පිටපත හා මෘදුකාංග පිටපත ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැළැස්විය යුතුය. මෘදුකාංග පිටපත media.accre@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ලැබීමට සැළැස්විය යුතුය.

v. අයදුම්පත ඉදිරිපත් කරනු ලබන දිනට පෙර මාස 06ක කාලයක් තුළ ලබාගත් අඟල් 1×1.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා එවිය යුතුය.

vi. දැනට පුවත් සපයනු ලබන සක්‍රිය වාර්තාකරුවන්ගේ නම් පමණක් නාමලේඛනයට ඇතුළත් කරන ලෙස මාධ්‍ය ආයතන ප්‍රධානින්/ ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

vii. අදාළ ඉල්ලුම්පත් **www.dgi.gov.lk**හෝ**www.news.lk** යන වෙබ් අඩවි වලින් බාගත හැකි අතර සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්මේන්තුව, අංක 163, කිරුළපනමාවත, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

viii. අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ “ප්‍රාදේශීය මාධ්‍යවේදී හැඳුනුම්පත” යනුවෙන් සටහන් කළ යුතුය.

**04. නිදහස් මාධ්‍යවේදීන්**

අවම වශයෙන් වසරක කාලයක් අඛණ්ඩව නිදහස් මාධ්‍යවේදියකු ලෙස ජාතික මට්ටමින් පිළිගත් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සේවය කර තිබිය යුතු අතර ඒ බව තහවුරු කිරීමට පහත සඳහන් අවශ්‍යතා ඉදිරිපත් කළ යුතුය.

i. අයදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස හයක කාලය තුළ තමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් පිළිබඳ පුවත්/ විශේෂාංග/විචිත්‍රාංග ආදිය අවම වශයෙන් දොළහකට නොඅඩු සංඛ්‍යාවක සහතික කරන ලද ඡායාපිටපත් හෝ සංයුක්ත තැටි හෝ ඉදිරිපත් කළ යුතුය.

ii. ප්‍රවෘත්ති, විශේෂාංගලිපි, කාලීන වැඩසටහන් සපයනු ලබන මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍ය ආයතන වෙතින් අවම වශයෙන් එක් ආයතනයකින් හෝ තම මාධ්‍ය ආයතනය වෙත අඛණ්ඩව පුවත් හෝ වැඩසටහන් සපයන බවට එම ආයතනයේ ලිපිශීර්ෂය සහිත ලිපියකින් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත නිදහස් මාධ්‍යවේදී හැඳුනුම්පත ලබාදෙන ලෙස ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. එය මාධ්‍ය ආයතන ප්‍රධානින්/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රධාන සංස්කාරක විසින් නම, අත්සන සමඟ නිලමුද්‍රාව තබා සහතික කළ යුතුවේ.

**05. රාජ්‍ය මාධ්‍ය නිලධාරීන්**

i. රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/රාජ්‍ය අනුබද්ධිත ආයතනවල සෘජුවම මාධ්‍ය තනතුරු සඳහා නිල වශයෙන් පත්වීම් සහිත මාධ්‍ය ලේකම්, මාධ්‍ය අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති නිලධාරි/ ඡායාරූප ශිල්පි/විඩියෝ කැමරා ශිල්පි වෙත රාජ්‍ය මාධ්‍ය නිලධාරි හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

ii. අදාළ අමාත්‍යාංශයේ ලේකම් හෝ අතිරේක ලේකම් විසින් තම අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයේ මාධ්‍ය රාජකාරි වල නිරත වන ඉහත තනතුර දරණ නිලධාරීන්ට හැඳුනුම්පත සඳහා අදාළ නම් සහ තනතුර සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය. අදාළ නාමලේඛනයේ පූර්ණ වගකීම එම ලේඛනය සහතික කරනු ලබන අමාත්‍යාංශය ලේකම්/ අතිරේක ලේකම් සතුවේ

iii. මාධ්‍ය ඒකකවල සේවය කළද ඉහත තනතුරු හැර වෙනත් තනතුරු දරන්නන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

iii. අමාත්‍යාංශයක් යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයක මාධ්‍ය ඒකක සඳහා මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කිරීමේ දී එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/සාමාන්‍යාධිකාරි විසින් නාම ලේඛනය හා අයදුම්පත්‍රය නම තනතුර සහිතව සහතික කළ යුතුය.

**06. සම්ප්‍රේක්ෂයන්**

i. පිළිගත් ජන මාධ්‍ය ආයතනයක සේවයේ නියුතු ප්‍රවෘත්ති හා කාලීන මාධ්‍ය වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන නිවේදකයින් සඳහා සම්ප්‍රේක්ෂ හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.
ii. ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා සම්ප්‍රේක්ෂ හැඳුනුම්පත් සඳහා අයදුම් කරන්නන් විසින් සම්පූර්ණ කළ යුතුය.

**07. මාධ්‍ය පරිපාලකයන්**

i. ජාතික මට්ටමන් පිළිගත් මාධ්‍ය ආයතනයක මාධ්‍ය පරිපාලනයට සෘජුවම දායකත්වය සපයන මාධ්‍ය පරිපාලකයන් සඳහා උපරිම වශයෙන් එක් මාධ්‍ය ආයතනයක තිදෙනකු සඳහා පමණක් මාධ්‍ය පරිපාලක හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

ii. මාධ්‍ය ආයතනවල අලෙවි ප්‍රවර්ධන අධ්‍යක්ෂවරුන්/ කළමනාකරුවන්/සුබසාධක නිලධාරීන් හෝ අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රවල සේවය කරන වෙනත් නිලධාරින් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

**08. මාධ්‍ය තාක්ෂණ ශිල්පීන්**

i. ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ රාජකාරිවල සෘජුවම නිරතවන විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ තාක්ෂණික ශිල්පීන්ට මාධ්‍ය තාක්ෂණ ශිල්පී හැඳුනුම්පත නිකුත් කෙරේ.
ii. ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා මාධ්‍ය තාක්ෂණ ශිල්පී හැඳුනුම්පත් සඳහා අයදුම් කරන්නන් විසින් සම්පූර්ණ කළ යුතුය.

**09. මාධ්‍යසේවා**

i. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශවල මාධ්‍ය කටයුතු සඳහා ආයතනයෙන් බැහැරව ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ කටයුතු සඳහා සෘජුව සහායවන්නන් වෙනුවෙන් මාධ්‍ය සේවා හැඳුනුම්පත නිකුත්කරනු ලැබේ.
ii. ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා මාධ්‍යසේවා හැඳුනුම්පත් සඳහා අයදුම් කරන්නන් විසින් සම්පූර්ණ කළ යුතුය.

**10. වෙබ් මාධ්‍යවේදීන්**

i. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ නිසි බලධරයා වන රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන විශේෂ කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ මත වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සළකා බලනු ලැබේ.

ii. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා කරන වෙබ් අඩවි සඳහා පමණක් වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු ලබන අතර ඒ පිළිබඳ විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත.

iii. වෙබ් අඩවි භාවිතය, අරමුණු ,අයිතිය,ග්‍රාහක සංඛ්‍යාව (Number & hits)දිනපතා යාවත්කාලීන වී තිබීම, ආදිය සැළකිල්ලට ගනු ලබන අතර සකස් කෙරෙන නව නිර්ණායකවලට අනුකූලව වෙබ් මාධ්‍ය සඳහා හැඳුනුම්පත් ලබාදෙනු ඇත.

iv. අදාළ වෙබ් අඩවිය 2020 වසර වෙනුවෙන් ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබිය යුතු අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂයභාර මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ එම ලියාපදිංචි සහතිකයේ පිටපතක් මාධ්‍යවේදී අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.කෙසේ වුවද ජනමාධ්‍ය විෂය භාර අමාත්‍යාංශයෙන් වෙබ් අඩවි ලියාපදිංචි සහතිකය ලබා තිබීම පමණක් මාධ්‍ය හැඳුනුම්පතක් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරාලීමක් නොවනු ඇත.

v. මාධ්‍ය හැඳුනුපත් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියක්ම මාධ්‍ය ආයතනයක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය (Business Registration ) ලබා තිබිය යුතු අතර එම ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.ව්‍යාපාරය ලියාපදිංචි කරනු ලබන ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් එය සහතික කළ යුතු වේ.

vi. වෙබ් අඩවි සඳහා මාධ්‍යහැඳුනුම්පත්ලබාගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබනඅයදුම්පත් රාජ්‍ය ආරක්ෂාව ඇතුළු අදාළ වෙනත්රාජ්‍ය ආයතනයන්හි නිර්දේශයට යොමු කෙරෙනු ඇත.වෙබ් අඩවි සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සළකා බලනුයේ අදාළ රාජ්‍ය ආයතනයන්හි නිර්දේශ සහිත වාර්තාවන් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂජනරාල් වෙත ලැබීමෙන් පසුවය.

vii. වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කරමින් මහජන සුබසිද්ධිය සඳහාම සත්‍ය, නිවැරදි හා කාලීන ප්‍රවෘත්ති සපයන වෙබ් අඩවි සඳහා පමණි.

viii. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම සඳහා අවම වශයෙන් මාස හයක කාලයක්, දෛනික වශා අඛණ්ඩව යාවත්කාලීන කරනු ලැබූ වෙබ් අඩවියක් විය යුතු අතර, එම වෙබ් අඩවිවල අවම වශයෙන් 35%ක ප්‍රමාණයක් ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු අන්තර්ගතවීම අනිවාර්යවේ. පුවත් වෙබ් අඩවියක් අවම වශයෙන් සතියකට ප්‍රවෘත්ති 30ක් වත් පළවිය යුතුය.

ix. එක් භාෂා මාධ්‍යයක් වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් 02ක උපරිමයකට යටත්ව වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

x. එක් පුද්ගලයකු හෝ සමාගමක් යටතේ වෙබ් අඩවි කිහිපයක් ලියාපදිංචි කර තිබෙන අවස්ථාවලදී එක් වෙබ් අඩවියකට පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

xi. වෙබ් මාධ්‍යකරණයෙහි යෙදී සිටින ජනමාධ්‍යවේදීන්ට පමණක් මාධ්‍ය හැඳුනුම්පත නිකුත්කරන අතර වෙබ් අඩවි පරිපාලක/ ගවනර්/පරිපාලන අධ්‍යක්ෂ ආදි මාධ්‍යවේදීන්ට පරිබාහිර තනතුරු සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු නොලැබේ.

xii. ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන විශේෂ කමිටුවේ නිර්දේශ මත වෙබ් අඩවි සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම සලකා බලනු ලැබේ.

xiii. වෙබ් මාධ්‍ය හැඳුනුපතක් වෙන් කරනුයේ සෘජුවම ප්‍රවෘත්ති වෙබ් අඩවි සඳහා පමණි. රාජ්‍ය නොවන සංවිධාන හෝ වෙනත් ආයතනික වෙබ් අඩවි තුල පළ කෙරෙන ප්‍රවෘත්ති පිටු පවත්වාගෙන යාම ප්‍රවෘත්ති වෙබ් අඩවියක් ලෙස පිළි නොගන්නා අතර එවැනි වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුපත් නිකුත් කරනු නොලැබේ.

**11. විදේශ මාධ්‍ය**

- **ස්ථිර**

i. ජාත්‍යන්තරව පිළිගත් විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකාවේ නියෝජිතයන්/ වාර්තාකරුවන් ලෙස එම ආයතන විසින් පත් කරනු ලැබ, ස්ථිර වශයෙන්ම අදාළ මාධ්‍ය ආයතනයේ සේවය කරනු ලබන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා පමණක් මෙම හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

ii. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනුයේ එම විදේශ මාධ්‍ය ආයතන වෙතින් ඉදිරිපත් කර ඇති තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසුවය.

**අවශ්‍ය ලිපිලේඛන**

i. අදාළ විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා සහතික කරන ලද ලිපිය

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි /ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත

iii. මාස 06ක කාලයක් තුළ ලබාගත් අඟල් 1x1.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අතර ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා එවිය යුතුය.

iv. ඉහත සඳහන් කළ ජාත්‍යන්තර පිළිගත් ප්‍රවෘත්ති සේවා ආයතනවලට අමතරව එම ආයතන නමින් හෝ වෙනත් ආයතන නමින් හෝ මෙරට හෝ විදේශයන්හි පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි සඳහා හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

- **තාවකාලික**

ප්‍රවෘත්ති හා කාලීන වැදගත්කමක් ඇති විශේෂ අවස්ථා ආවරණය කිරීම සහ ප්‍රවෘත්තිමය වටිනාමකින් යුත් වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ මාධ්‍යවේදීන් සඳහා තාවකාලික මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු ලැබේ.

**අවශ්‍යලිපි ලේඛණ**

i. අදාළ විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානිනියා සහතික කරන ලද ලිපිය
ii. විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත ලිපිය
iii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iv. මාස 06ක කාලයක් තුළ ලබාගත් අඟල් 1x1.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා එවිය යුතුය.

**පොදුකොන්දේසි**

01. 2020 වසර වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම සඳහා අයදුම්පත් භාරගැනීම 2020 මාර්තු 31 වැනි දිනින් අවසන් කෙරේ. එදිනට පසුව භාරදෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. මාසික ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 3ක් හා ද්විමාසික ප්‍රකාශන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත්උපරිමය 2ක් නිකුත් කරනු ලැබේ.

03. මාධ්‍ය ආයතන වෙතින් තම ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන බව තහවුරු කරනු පිණිස මෑතක දී පිළිවෙළින් පළ කරන ලද අදාළ ප්‍රකාශනයේ පිළිවෙලින් කළාප 06ක් සහ ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

04. සෑම ප්‍රකාශනයක් සඳහාම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

05. යම් කිසි පුවත්පතක් සමඟ නිකුත් කරනු ලබන අතිරේක වෙනම පුවත්පතක් ලෙස නොසැළකෙන අතර, එම අතිරේක වෙනුවෙන් හැඳුනුම්පත් අයදුම් කරන මාධ්‍යවේදීන් හට අදාළ ප්‍රධාන පුවත්පත නමින්ම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

06. මාධ්‍ය ආයතනයක සේවයෙන් ඉවත් කරන/ ඉවත්ව යනු ලබන මාධ්‍යවේදියකුගේ හැඳුනුම්පත නැවත ලබාගෙන රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වනු ඇත. එසේ නැවත භාරදීමකින් තොරව ඒ වෙනුවට වෙනත් තැනැත්තකු වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

07. සිනමා/ ටෙලිනාට්‍ය/ වේදිකානාට්‍ය වැනි ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රවල නියුතු ශිල්පීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු නොලැබේ.

08. ප්‍රචාරක හා දැන්වීම් ආයතන හා වීඩියෝ නිෂ්පාදන ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

09. අස්ථානගත වූ මාධ්‍ය හැඳුනුම්පතක් වෙනුවට නැවත හැඳුනුම්පතක් ලබාගැනීමේදී එම අස්ථාන ගතවීම පිළිබඳව පොලිසියේ පැමිණිලි කිරීමෙන් අනතුරුව අදාළ පොලිස් ස්ථානය විසින් නිකුත් කරනු ලබන පොලිස් වාර්තාවේ සහතික කරන ලද මුල් පිටපත සමඟ සේවය කරන ආයතනය මගින් මාධ්‍ය හැඳුනුම්පතක් නැවත ලබාදෙන ලෙස රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතුය.

10. අන්වර්ථනාම යටතේ ප්‍රවෘත්ති/විශේෂාංග/වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන ජනමාධ්‍යවේදීන් සඳහා එම අන්වර්ථනාමයන්ගෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු නොලැබේ.

11. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා නොකරන මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනු නොලැබේ.

12. විවිධ විෂය ක්ෂේත්‍ර සඳහා පළකෙරෙන අත්පොත් (Guide Books) හෝ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරුවලින් බැහැර ප්‍රකාශන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

13. මෙම මාධ්‍ය හැඳුනුම්පත මාධ්‍ය රාජකාරි කටයුතු සඳහා පමණක් භාවිත කළ යුතුය. යම් හෙයකින් අවභාවිතාකිරීම පිළිබඳව හෝ ජනමාධ්‍ය ආචාරධර්මවලට පටහැනිව කටයුතුකිරීම් වැනි අවස්ථා වාර්තා වුවහොත් මාධ්‍ය හැඳුනුම්පත අවලංගුකිරීමේ හෝ එම මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත නැවතභාරදෙන ලෙස නියෝග කිරීමේ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්සතුවේ.

14. ආයතනගත/ මාණ්ඩලික ජනමාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කරනුයේ වසරකට එක්වරක් පමණි. අදාළ ආයතන විසින් වරින්වර කෙරෙන ඒ පිළිබඳව කරනු ලබන ඉල්ලීම් සලකා නොලබන අතර එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

15. වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම පිළිබඳව සළකා බලනුයේ අදාළ මාධ්‍යයට සපයන ලද ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු ඇතුළත් වාර්තා, විශේෂාංග, ඡායාරූප හෝ විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වල ප්‍රමාණාත්මක බව මනාව තහවුරු කරගැනීමෙන් පසුවය.

16. කළමනාකාර සහකාර/සම්බන්ධීකාරක වැනි ඍජුවම මාධ්‍ය වාර්තාකරණයට අදාළ නොවන තනතුරු දරන්නන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

17. ගෞරව නාම හා අධ්‍යාපන සුදුසුකම් සහිත නාම සඳහන් නොකරන අතර හැඳුනුම්පතෙහි සඳහන් කරනුයේ මාධ්‍යවේදියාගේ නම පමණි

18. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනුබද්ධිත ආයතනවල ආයතනික වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකරනු ලැබේ.

19. කේබල් රූපවාහිනී ආයතන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා එම රූපවාහිනී නාලිකාව ඔස්සේ අවම වශයෙන් සතියකට ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් 05ක් හෝ විකාශය වී තිබිය යුතුය. එම අවශ්‍යතාව සපුරා ඇති කේබල් රූපවාහිනී ආයතනයන්හි ප්‍රවෘත්ති අංශය සඳහා පමණක් එක් භාෂා මාධ්‍යයක් සඳහා 02ක් බැගින් වන පරිදි උපරිමය 06 කට යටත්ව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කේබල් රූපවාහිනී සේවා සඳහා ලබාදෙන බලපත්‍රයන්හි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

20. මෙම මාධ්‍ය හැඳුනුම්පත හුදෙක් පෞද්ගලික අභිමතාර්ථ වෙනුවෙන් වෙනත් අවශ්‍යතා සඳහා භාවිතා නොකිරීම වෘත්තීය මාධ්‍යවේදීන් සතු වගකීමකි.

21. මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත්කිරීම පිළිබඳ අවසාන තීරණය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු අතර, ඉහත කොන්දේසි හා අවශ්‍යතා කාලීන වශයෙන් වෙනස් කරලීමේ බලයද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුවේ.

22. පෞද්ගලික අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් මුද්‍රිත හෝ විද්‍යුත් හෝ වෙබ් හෝ මාධ්‍ය හැඳුනුම්පත් භාවිත කිරීම පිළිබඳ පැමිණිලි ලද හොත් ඒ පිළිබඳ විමර්ශනය කර අදාළ මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය හැඳුනුම්පත අවලංගු කිරීමේ පූර්ණ බලතල ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුය.

නාලක කලුවැව,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

12-429

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.